OL/2025(2026)/81/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**81 S I, II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)**
**General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)**

| | | |
|---|---|---|
| **කෘෂි හා ආහාර තාක්ෂණය** | **I, II** | **පැය තුනයි** |
| விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் | **I, II** | *மூன்று மணித்தியாலம்* |
| Agriculture and Food Technology | **I, II** | *Three hours* |

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කෘෂි හා ආහාර තාක්ෂණය I

*උපදෙස්:*

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** හරිත විප්ලවය සමග ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ සිදු වූ ප්‍රධානතම වෙනස්කමකි,
(1) වගා බිම් සඳහා ජලය සැපයීමට වැව්, අමුණු ඉදි කිරීම.
(2) කෙටි කාලයක් තුළ වැඩි අස්වනු ලබා දෙන වී වර්ග හඳුන්වා දීම.
(3) තේ, කෝපි, කොකෝවා ආදී වැවිලි බෝග හඳුන්වා දීම.
(4) කාබනික කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.

**2.** ශ්‍රී ලංකාවට දෙවන අන්තර් මෝසම් වැසි ලැබෙන කාල සීමාව වන්නේ
(1) මාර්තු සිට අප්‍රේල් ය. (2) මැයි සිට ජූනි ය.
(3) අගෝස්තු සිට සැප්තැම්බර් ය. (4) ඔක්තෝබර් සිට නොවැම්බර් ය.

**3.** කොම්පෝස්ට් නිෂ්පාදනයේ දී මුහුන් ලෙස යොදා ගත හැකි ද්‍රව්‍යයකි,
(1) ගව මූත්‍ර. (2) අළු හුනු.
(3) පරණ කොම්පෝස්ට්. (4) ගොම.

**4.** අන්තර්ජාතික පාංශු විද්‍යා සංගමයේ වර්ගීකරණයට අනුව විෂ්කම්භය මිලිමීටර 0.002ට වඩා කුඩා පාංශු ඛනිජ වර්ගීකරණය කර ඇත්තේ
(1) මැටි ලෙස ය. (2) රොන්මඩ ලෙස ය.
(3) සියුම් වැලි ලෙස ය. (4) රළු වැලි ලෙස ය.

**5.** වී සහ බෝංචි යන බෝග අයත්වන ශාක කුල පිළිවෙළින්,
(1) මැල්වේසියේ සහ කුකර්බිටේසියේ ය. (2) සොලනේසියේ සහ පොඒසියේ ය.
(3) පොඒසියේ සහ ෆැබේසියේ ය. (4) ඇරිකේසියේ සහ මැල්වේසියේ ය.

**6.** ශ්‍රී ලංකාවේ වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර 2500 ට වැඩි හා උච්චත්වය මීටර 900 ට වැඩි ප්‍රදේශ අයත් වන කෘෂි දේශගුණික කලාපය වන්නේ
(1) උඩරට තෙත් කලාපයයි. (2) මැදරට තෙත් කලාපයයි.
(3) උඩරට අතරමැදි කලාපයයි. (4) මැදරට අතරමැදි කලාපයයි.

**7.** බෝග වගාවට සුදුසු පසක පැවතිය යුතු A, B, C, D යන පාංශු සංඝටක සහ ඒවායේ ප්‍රතිශත පහත වට ප්‍රස්තාරයෙන් දැක්වේ. එම A, B, C, D වලින් දැක්වෙන සංඝටක නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.




| | A | B | C | D |
|---|---|---|---|---|
| (1) | ජලය | වාතය | කාබනික ද්‍රව්‍ය | ඛනිජ |
| (2) | ඛනිජ | ජලය | වාතය | කාබනික ද්‍රව්‍ය |
| (3) | කාබනික ද්‍රව්‍ය | ඛනිජ | ජලය | වාතය |
| (4) | වාතය | ජලය | ඛනිජ | කාබනික ද්‍රව්‍ය |

[දෙවැනි පිටුව බලන්න.

**8.** පසක ඇති ඛනිජ ද්‍රව්‍යවල සාපේක්ෂ ප්‍රමාණය මත එම පසෙහි

(1) වයනය තීරණය වේ. (2) ව්‍යුහය තීරණය වේ.
(3) වර්ණය තීරණය වේ. (4) ගැඹුර තීරණය වේ.

**9.** ද්විබීජපත්‍රී බීජවල ප්‍රරෝහණයට අවශ්‍ය ආහාර සංචිතව පවතින්නේ

(1) බීජාවරණයේ ය. (2) බීජ මූලයේ ය.
(3) බීජාංකුරයේ ය. (4) බීජ පත්‍ර තුළ ය.

**10.** මුල් මගින් ප්‍රචාරණය වන බෝග වනුයේ,

(1) දෙල්, බෙලි හා කරපිංචා ය. (2) මඤ්ඤොක්කා, රෝස හා වද ය.
(3) බිගෝනියා, පෙපරෝමියා හා සැන්සවේරියා ය. (4) කිරි අල, කෙසෙල් හා අර්තාපල් ය.

**11.** වැපිරීමට ගන්නා බිත්තර වීවල තිබිය යුතු අවම ප්‍රරෝහණ ප්‍රතිශතය

(1) 100% කි. (2) 90% කි. (3) 85% කි. (4) 80% කි.

**12.** දර්ශීය පාංශු පැතිකඩක දළ රූපසටහනක් පහත දැක්වේ. මෙහි O, A, B, C, R වලින් දැක්වෙන ස්තර නිවැරදි ව අනුපිළිවෙලින් සඳහන් වරණය තෝරන්න.




| | O | A | B | C | R |
|---|---|---|---|---|---|
| (1) | කාබනික ද්‍රව්‍ය | උඩු පස | යටි පස | මාතෘ ද්‍රව්‍ය | මාතෘ පාෂාණය |
| (2) | උඩු පස | යටි පස | කාබනික ද්‍රව්‍ය | මාතෘ පාෂාණය | මාතෘ ද්‍රව්‍ය |
| (3) | මාතෘ ද්‍රව්‍ය | උඩු පස | යටි පස | කාබනික ද්‍රව්‍ය | මාතෘ පාෂාණය |
| (4) | කාබනික ද්‍රව්‍ය | මාතෘ ද්‍රව්‍ය | උඩු පස | මාතෘ පාෂාණය | යටි පස |

**13.** වැඩිම නයිට්‍රජන් ප්‍රතිශතයක් අඩංගු පොහොර වර්ගයක් වන්නේ

(1) ඇමෝනියම් සල්ෆේට් ය. (2) යූරියා ය.
(3) එප්පාවල ඇපටයිට් ය. (4) ඩොලමයිට් ය.

**14.** බෝග වගාවකට ජල සම්පාදනය කළ යුත්තේ, පස

(1) ජලයෙන් සංතෘප්ත වන තුරු ය. (2) තාවකාලික මැලවීමේ අංකයට පත් වූ පසු ව ය.
(3) ක්ෂේත්‍ර ධාරිතාවට පත් වන තුරු ය. (4) ස්ථිර මැලවීමේ අංකයට පත් වූ පසු ව ය.

**15.** ඩැපොග් තවානක ඇති ගොයම් පැළ ක්ෂේත්‍රයේ සිටුවීමට යෝග්‍ය වන්නේ තවාන් දමා දින කීයකට පසුව ද?

(1) දින 7 - 10 (2) දින 10 - 14 (3) දින 14 - 17 (4) දින 17 - 21

**16.** දඬු කැබලි මුල් ඇද්දවීම උත්තේජනය කරන හෝර්මෝනයක් වන්නේ

(1) පොටෑසියම් මෙටාබයිසල්ෆයිට් ය. (2) මැග්නීසියම් සල්ෆේට් ය.
(3) ඉන්ඩෝල් ඇසිටික් ඇසිඩ් ය. (4) සෝඩියම් බයිකාබනේට් ය.

**17.** ශාක වාතයෙන් පමණක් ලබා ගන්නා මහා පෝෂකය වන්නේ

(1) කාබන් ය. (2) ඔක්සිජන් ය. (3) හයිඩ්‍රජන් ය. (4) නයිට්‍රජන් ය.

**18.** නව ලක්ෂණ සහිත දිරිමත් පැළ ලබා ගැනීමට භාවිත කළ යුතු ශිල්පීය ක්‍රමය වන්නේ

(1) පටක රෝපණයයි. (2) දෙමුහුම් කිරීමයි.
(3) බද්ධ කිරීමයි. (4) අතු බැඳීමයි.

**19.** බිත්තර වී වැපිරීමට පෙර ජලයේ පොඟවා මුල් අද්දවා ගත යුතු ය. මෙසේ ජලයෙන් පෙඟවිය යුතු කාලය

(1) පැය 6 කි. (2) පැය 12 කි. (3) පැය 24 කි. (4) පැය 48 කි.

**20.** බද්ධ අඹ වගාවක, ශාක අතුවලට දරාගත නොහැකි තරම් ඵල විශාල සංඛ්‍යාවක් හටගෙන තිබුණි. මෙහි දී කළ යුත්තේ

(1) අතු කඩා වැටීම වැළැක්වීමට ආධාරක යෙදීම ය. (2) වගාවට වැඩිපුර පොහොර යෙදීම ය.
(3) නියමිත කාලයට ඵල ආවරණය කිරීම ය. (4) ඵල තුනී කිරීම ය.

**21.** ශරීර ස්කන්ධ දර්ශකය (BMI) ගණනය කිරීමට යොදා ගන්නා සමීකරණය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) $\dfrac{\text{ශරීරයේ බර (kg)}}{\text{උස}^2\text{ (m)}}$ (2) $\dfrac{\text{ශරීරයේ බර (kg)}}{\text{උස (m)}}$

(3) $\dfrac{\text{ශරීරයේ බර}^2\text{ (kg)}}{\text{උස (m)}}$ (4) $\dfrac{\text{උස}^2\text{ (cm)}}{\text{ශරීරයේ බර (kg)}}$

**22.** පහත සඳහන් රූපසටහන සලකා බලන්න.



ඉහත දැක්වෙන්නේ,

(1) සරල අතු බැඳීම ය.
(2) සංයුක්ත අතු බැඳීම ය.
(3) වායව අතු බැඳීම ය.
(4) සාමාන්‍ය අතු බැඳීම ය.

**23.** බෝගයට වැළඳෙන රෝගය සහ එහි රෝග කාරකය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

| | බෝගය | රෝගය | රෝග කාරකය |
|---|---|---|---|
| (1) | තක්කාලි | දියමලන් කෑම | වෛරස් |
| (2) | වම්බටු | හිටු මැරීම | දිලීර |
| (3) | අඹ | ඇන්ත්‍රැක්නෝස් | බැක්ටීරියා |
| (4) | බණ්ඩක්කා | පත්‍ර විචිත්‍රය | වෛරස් |

**24.** කිරි දෙනුන්ගේ බුරුල්ල ඉදිමී, රත් පැහැ ගැන්වී, උණුසුම් බවක් පෙන්වයි නම් මෙම දෙනුනට වැළඳී ඇතැයි සැක කළ හැකි රෝගය වන්නේ

(1) කිරි උණ ය.
(2) මැස්ටයිටිස් ය.
(3) ගව රක්තාශ්‍රැව රෝගය ය.
(4) කාලගාත්‍ර රෝගය ය.

**25.** ජීවාණුහරිත තත්ත්ව යටතේ ආහාර ඇසිරීමේ දී

(1) ආහාරවල නිෂ්පාදන වියදම අඩු ය.
(2) ශීතකරණය තුළ ගබඩා කිරීම අත්‍යවශ්‍ය වේ.
(3) හානිදායී ක්ෂුද්‍රජීවීන් පමණක් විනාශ වේ.
(4) ආහාර ද්‍රව්‍ය සහ ඇසුරුම ඉහළ උෂ්ණත්වයකට ලක් කෙරේ.

**26.** කුකුළන්ට වැළඳෙන රනිකට් රෝගයේ රෝග කාරකය

(1) බැක්ටීරියාවකි.
(2) දිලීරයකි.
(3) ප්‍රෝටොසොවාවෙකි.
(4) වෛරසයකි.

**27.** ගව පැටවකු බිහි වූ පසු පළමුවෙන් ම කළ යුතු වන්නේ

(1) මුල් කිරි (කොලෙස්ට්‍රම්) බීමට සැලැස්වීම ය.
(2) පණු බෙහෙත් ලබා දීම ය.
(3) පැටවා හඳුනාගැනීම සඳහා අංකනය කිරීම ය.
(4) පැටවා මවගෙන් වෙන් කිරීම ය.

**28.** ශ්‍රී ලංකාවේ ඇති කිරීමට වඩාත් සුදුසු ඉන්දීය කිරිගව වර්ග වනුයේ

(1) සින්දි සහ සහිවාල් ය.
(2) කිලාරි සහ කන්ගායම් ය.
(3) ප්‍රීෂියන් සහ අයර්ෂයර් ය.
(4) තිලිරච්චි සහ මුරා ය.

**29.** බිම් සැකසීමේ උපකරණ පිළිබඳ වූ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - තැටි නගුල සත්ත්ව බලයෙන් ක්‍රියාකරවන බිම් සැකසීමේ උපකරණයකි.
B - රොටවේටරය හා කොකු නගුල ද්විතීයික බිම් සැකසීමේ උපකරණ වේ.
C - ජපන් රොටරි වීඩරය හා අත් මුල්ලුව අතුරුයත් ගෑමේ උපකරණ වේ.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ

(1) A පමණි.
(2) A සහ B පමණි.
(3) A සහ C පමණි.
(4) B සහ C පමණි.

**30.** බෝග වගාවක ප්‍රධාන බෝගය අතර තවත් බෝගයක් නිසි පරතරයක් ඇති ව වගා කිරීම හඳුන්වන්නේ

(1) ශෂ්‍ය මාරු බෝග වගාව ලෙස ය.
(2) අතුරු බෝග වගාව ලෙස ය.
(3) කඩින්කඩ බෝග වගාව ලෙස ය.
(4) මිශ්‍ර බෝග වගාව ලෙස ය.

**31.** බිත්තර සඳහා කිකිළියන් ඇති කිරීමේ දී දිනක් වයසේ සිට සති 8ක් දක්වා කාලය හඳුන්වන්නේ

(1) බෲඩර අවධිය ලෙස ය.
(2) පැටවු අවධිය ලෙස ය.
(3) වර්ධක අවධිය ලෙස ය.
(4) පරිණත අවධිය ලෙස ය.

37760

**32.** සූර්යතාපය ආධාරයෙන් තවානක් ජීවානුහරණය කිරීමේ දී, තවාන
  (1) වියළෙන්නට හැර කළු පොලිතිනයකින් ආවරණය කළ යුතු ය.
  (2) තෙත් කර කළු පොලිතිනයකින් ආවරණය කළ යුතු ය.
  (3) තෙත් කර විනිවිද පෙනෙන පොලිතිනයකින් ආවරණය කළ යුතු ය.
  (4) සති දෙකක් හොඳින් සූර්යාලෝකය ලැබීමට සැලැස්විය යුතු ය.

**33.** පහත දැක්වෙනුයේ තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය මගින් සාපේක්ෂ ආර්ද්‍රතාව ගණනය කිරීමට යොදා ගන්නා වගුවෙන් කොටසකි.

වියළි බල්බ සහ තෙත් බල්බ උෂ්ණත්වමාන පාඨාංක අතර වෙනස ($^0C$)

| වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංකය ($^0C$) $^0C$ | 0.5 | 1.0 | 1.5 | 2.0 | 2.5 | 3.0 |
|---|---|---|---|---|---|---|
| 25 | 96 | 92 | 88 | 84 | 81 | 77 |
| 26 | 96 | 92 | 88 | 85 | 81 | 78 |
| 27 | 96 | 92 | 89 | 85 | 82 | 78 |
| 28 | 96 | 93 | 89 | 85 | 82 | 78 |
| 29 | 96 | 93 | 89 | 86 | 82 | 79 |
| 30 | 96 | 93 | 89 | 86 | 83 | 79 |

වියළි බල්බ උෂ්ණත්වමානයේ පාඨාංකය 29 $^0C$ ක් සහ තෙත් බල්බ උෂ්ණත්වමානයේ පාඨාංකය 27 $^0C$ ක් නම්, එම අවස්ථාවේ දී සාපේක්ෂ ආර්ද්‍රතාව වන්නේ
  (1) 82% කි.  (2) 84% කි.  (3) 86% කි.  (4) 88% කි.

**34.** පාලිත තත්ත්ව යටතේ වගා කිරීමේ දී යොදා ගත හැකි තාවකාලික වගා ව්‍යුහයකි
  (1) හරිතාගාර.  (2) ලී පටි ගෘහ.  (3) වීදුරු ගෘහ.  (4) සරල සූර්ය ප්‍රචාරක.

**35.** පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
  (1) හාල්මැස්සන් සමග තක්කාලි නිතර ආහාරයට ගැනීම, මුත්‍ර ගල් සෑදීමට හේතු වේ.
  (2) භාජනයේ පියන වසා මඤ්ඤොක්කා තැම්බීම වඩාත් සුදුසු වේ.
  (3) දිනක දී එක් පුද්ගලයෙක් ආහාරයට ගත යුතු ලුණු ප්‍රමාණය ග්‍රෑම් 10ක් වේ.
  (4) බදින ලද රටකජු එතීම සඳහා පුවත්පත් කඩදාසි සුදුසු වේ.

**36.** කුකුළු නිවාසයක් පිහිටුවීම පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
  (1) ජලය, විදුලිය හා ප්‍රවාහනය වැනි යටිතල පහසුකම් සහිත ස්ථානයක් විය යුතු ය.
  (2) නිවාසයේ දික් අක්ෂය උතුරු-දකුණු දිශාව ඔස්සේ පිහිටුවිය යුතු ය.
  (3) සෙන්ටිමීටර 100 ක් පමණ උසට බිත්ති බැඳ ඉතිරි කොටස දැල් මගින් ආවරණය කළ යුතු ය.
  (4) බිමට ටයිල් අතුරා සුමට පෘෂ්ඨයක් සහිත ව සැකසිය යුතු ය.

**37.** ආහාරවල අගය වැඩි කිරීමේ අවස්ථාවක් දැක්වෙන්නේ පහත සඳහන් කුමන ප්‍රකාශයෙහි ද?
  (1) මස් කල්තබා ගැනීම සඳහා සෝඩියම් නයිට්‍රේට් එකතු කිරීම.
  (2) මුදවාපු කිරි නිෂ්පාදනයේ දී මුහුන් එකතු කිරීම.
  (3) මේද රහිත කිරිපිටි නිෂ්පාදනයේ දී විටමින එකතු කිරීම.
  (4) පලතුරු බීම නිෂ්පාදනයේ දී පොටෑසියම් මෙටාබයිසල්ෆයිට් එකතු කිරීම.

**38.** ලැක්ටික් අම්ල පැසවීම මගින් පරිරක්ෂණය කරනු ලබන නිෂ්පාදනයකි
  (1) යෝගට්.  (2) වයින්.  (3) පාන්.  (4) බියර්.

**39.** වල් පැළෑටි සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
  A - කුප්පමේනිය හා මොණරකුඩුම්බිය බහුවාර්ෂික වල් පැළෑටිවලට නිදසුන් වේ.
  B - පළිබෝධයින්ට වාසස්ථාන සපයයි.
  C - බීජ විශාල සංඛ්‍යාවක් නිපදවන නිසා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වේ.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ
  (1) A පමණි.  (2) A සහ B පමණි.  (3) A සහ C පමණි.  (4) B සහ C පමණි.

**40.** පහත දැක්වෙන්නේ කෘමි පළිබෝධ පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
  A - එපිලැක්නා කුරුමිණියා වම්බටු පත නාරටි, දැලක් ආකාරයට ඉතිරිවන සේ පත්‍ර කා දමයි.
  B - ගොයම් මකුණා අර්ධ රූපාන්තරණය සහිත වන අතර වී ශාකයේ ළපටි බීජවල යුෂ උරා බොයි.
  C - ඉල් මැස්සා සොලනේසියේ කුලයේ භෝගවලට හානි කරන අතර පත්‍ර කා දැමීම ද සිදු කරයි.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වන්නේ
  (1) A පමණි.  (2) A සහ B පමණි.  (3) A සහ C පමණි.  (4) B සහ C පමණි.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**81 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

කෘෂි හා ආහාර තාක්ෂණය I, II
விவசாயமும் உணவுத் தொழினுட்பவியலும் I, II
Agriculture and Food Technology I, II

## කෘෂි හා ආහාර තාක්ෂණය II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න.

1. වියළි කලාපයේ හෙක්ටාර 2ක පමණ ජල පහසුකම් සහිත ඉඩමක් හිමි ගොවි මහතෙක් බෝග වගාව හා සත්ත්ව පාලනය යන අංග ඇතුළත් ගොවිපොළක් ආරම්භ කළේ ය.

(i) (a) වියළි කලාපයට වැඩි ම වර්ෂාපතනයක් ලැබෙන්නේ කුමන මෝසම් වැසි මගින් ද?

(b) එම මෝසම් වැසි උපයෝගී කරගෙන වගා කරන කන්නය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ii) මෙම ඉඩමෙහි බිම් සැකසීම සඳහා යොදා ගත හැකි සිව්රෝද ට්‍රැක්ටරයට සවි කරන නගුල් වර්ග **දෙකක්** ලියන්න.

(iii) මෙම ගොවිපොළේ පසෙහි pH අගය 5.5ක් බව පාංශු විශ්ලේෂණයෙන් අනාවරණය විය. එය උදාසීන කිරීමට යෙදිය හැකි ද්‍රව්‍යයක් ලියන්න.

(iv) ඉහත ගොවිපොළේ ඇති පැපොල් වගාවකට යොදා ගත හැකි ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රමය සඳහන් කරන්න.

(v) මෙම ගොවිපොළේ වගා කළ හැකි සොලනේසියේ කුලයේ එළවළු බෝග **දෙකක්** සඳහන් කරන්න.

(vi) (a) සොලනේසියේ කුලයේ බෝගවලට නිතර වැළඳෙන රෝගයක් නම් කරන්න.

(b) එම රෝගයේ රෝග කාරකය සඳහන් කරන්න.

(vii) මෙම ගොවිපොළේ බෝග වගාව සඳහා සිදු කරන අතුරුයත් ගැමට අයත් කාර්ය **දෙකක්** ලියන්න.

(viii) ඝන ආස්තරණ ක්‍රමයට අනුව මෙම ගොවිපොළේ කුකුළු පාලන ඒකකයක් ආරම්භ කරන්නේ නම් ආස්තරණය ලෙස යොදාගත හැකි ද්‍රව්‍ය **දෙකක්** සඳහන් කරන්න.

(ix) මෙම ගොවිපොළේ නිෂ්පාදිත කිරිවලින් අතිරික්තය පහසුවෙන් පරිරක්ෂණය කළ හැකි ක්‍රම **දෙකක්** ලියන්න.

(x) මෙම ගොවිපොළ සමෝධානිත ගොවිපොළක් බවට පත් කිරීම සඳහා මෙහි ඇති ඒකකවලට අමතරව, අනිවාර්යයෙන් ම එකතු කළ යුතු ඒකකය කුමක් ද?

2. ගොවි මහතෙක් තම එළවළු වගාවේ, රන්වන් පැහැති විනිවිද පෙනෙන පියාපත් සහිත කෘමි විශේෂයක් සිටින බව නිරීක්ෂණය කළේ ය. එම කෘමියා ඵල විද බිත්තර දමන බව සහ ඒවායින් පිටවන කීටයන් ඵලය ආහාරයට ගැනීම නිසා ඵල කුණුවන බව ද දැකිය හැකි විය. එම කෘමියාගේ විශාලනය කරන ලද රූපසටහනක් මෙහි දැක්වේ.



(i) (a) මෙම කෘමියාගේ නම කුමක් ද?

(b) මෙම කෘමියා හානි කරන බෝග **දෙකක්** නම් කරන්න.

(c) මෙම කෘමියා හානි කරන බෝග අයත් කුලය කුමක් ද?

(ii) (a) ඉහත කෘමියා මර්දනයට යොදාගන්නා පෙරමෝන උගුලෙහි රූපසටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න.

(b) ඒ සඳහා යොදා ගන්නා පෙරමෝනයේ නම කුමක් ද?

(iii) බෝග වගාවේ දී රසායනික කෘමිනාශක භාවිත නොකර කෘමි හානි අවම කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කරන්න.

[හයවැනි පිටුව බලන්න.

3. වර්තමානයේ පලතුරු වගාව සඳහා බහුල ව යොදා ගන්නේ බද්ධ පැළ ය.

(i) බීජ පැළ සිටුවීමට වඩා බද්ධ පැළ සිටුවීමෙන් ලැබෙන වාසි **හතරක්** ලියන්න.

(ii) (a) බද්ධ කිරීම සඳහා ග්‍රාහක ශාකයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න.

(b) බද්ධ කිරීමේ දී බද්ධ සන්ධිය පොලිතීන් පටියකින් වෙළනු ලැබේ. මෙසේ වෙළීමේ අරමුණු **දෙකක්** ලියන්න.

(iii) පටක රෝපණයේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** වෙන වෙන ම ලියන්න.

4. බෝග වගා මාධ්‍යය වන පස නිර්මාණය වන්නේ මාතෘ පාෂාණය ජීරණය වීමෙන් ය.

(i) පාෂාණ ජීරණයට බලපාන භෞතික සාධක **හතරක්** ලියන්න.

(ii) (a) පාෂාණ ඒවායේ සම්භවය අනුව වර්ග තුනකට බෙදිය හැකි ය. එයින් වර්ග **දෙකක්** නම් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලව දක්නට ලැබෙන මහා පස් කාණ්ඩය සඳහන් කරන්න.

(iii) (a) කෘෂිකර්මයේ දී පාංශු කාබනික ද්‍රව්‍යවල වැදගත්කම් **හතරක්** ලියන්න.

(b) පාංශු ඛාදනය නිසා කෘෂිකර්මාන්තයට වන අයහපත් බලපෑම් **තුනක්** සඳහන් කරන්න.

5. වර්තමානයේ බොහෝ ආහාර වර්ග ඇසුරුම් කර වෙළෙඳපොළට ඉදිරිපත් කරනු ලැබේ.

(i) (a) ආහාර ඇසුරුම් කිරීමේ අවශ්‍යතා **හතරක්** සඳහන් කරන්න.

(b) ස්වාභාවික ඇසුරුම් ද්‍රව්‍ය **හතරක්** ලියන්න.

(ii) (a) ආහාර ලේබලයක අනිවාර්යයෙන් ඇතුළත් කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.

(b) ආහාර සම්බන්ධ ව හඳුන්වා දී ඇති ප්‍රමිති වර්ග **දෙකක්** ලියන්න.

(iii) ආහාර පරිරක්ෂණය කිරීමෙන් ලැබෙන වාසි **හතරක්** සඳහන් කරන්න.

6. ජීවී බීජයකට ප්‍රරෝහණය සඳහා අවශ්‍ය සාධක ලබාදුන්න ද එම බීජ ප්‍රරෝහණය නොවී පැවතීම බීජ සුප්තතාව යි.

(i) (a) බීජ සුප්තතාවේ වැදගත්කම සඳහන් කරන්න.

(b) බීජ සුප්තතාව ඇති වීමට හේතු **තුනක්** උදාහරණ සහිත ව සඳහන් කරන්න.

(ii) බීජ සුප්තතාව ඉවත් කරන ක්‍රම **තුනක්** උදාහරණ සහිත ව දක්වන්න.

(iii) (a) සුප්තතාව ඉවත් කිරීමට අමතර ව බීජ ප්‍රතිකාර කිරීමේ අරමුණු **දෙකක්** ලියන්න.

(b) බීජ ප්‍රරෝහණයට අවශ්‍ය සාධක **හතරක්** සඳහන් කරන්න.

7. සත්ත්ව පාලනයේ දී උපරිම ලාභයක් ලබා ගැනීම සඳහා මනා පාලනයක් අවශ්‍ය වේ.

(i) (a) ගොවිපොළ සතුන් රෝගී වූ විට දක්නට ලැබෙන පොදු රෝග ලක්ෂණ **හතරක්** ලියන්න.

(b) කුකුළන්ගේ හොට කැපීමේ අරමුණක් සඳහන් කරන්න.

(ii) බෲඩරයක් තුළ

(a) අඩු උෂ්ණත්වයේ දී

(b) වැඩි උෂ්ණත්වයේ දී

කුකුළු පැටවුන්ගේ හැසිරීම වෙන වෙන ම රූපසටහන් මගින් දක්වන්න.

(iii) ගවයන්ට වැළඳෙන කුර හා මුඛ රෝගයේ,

(a) රෝග කාරකය සඳහන් කරන්න.

(b) රෝග ලක්ෂණ **දෙකක්** ලියන්න.

(c) රෝග පාලන ක්‍රමයක් නම් කරන්න.

* * *